Sinhalese | සිංහල

# අපගේ නේවාසිකයන් ආරක්ෂිතව සහ හොඳින් තබා ගැනීමට අපට උදව් කරන්න

**නේවාසිකයන්ගේ සෞඛ්‍යය අපගේ අග්‍ර ප්‍රමුඛතාවයයි.**

වසරේ සෑම දිනක ම, දවසේ පැය 24 පුරා ම අවශ්‍ය රැකවරණය සහ සහයෝගය ඔවුන්ට ලැබෙන බව සහතික කිරීමට අපි කැපවී සිටින්නෙමු.

## 1

**යමෙකු රාත්‍රියේ, හෝ සති අන්තයේ අසනීප වුවහොත් කුමක් සිදුවේද?**



- කඩිනමින් උපකාර ලබා ගත හැකි බව තහවුරු කර ගැනීමට අපට බොහෝ විකල්ප පවතියි.
- අප සමඟ හෙදියක් සිටින අතර, වෛද්‍යවරුන්, අනෙකුත් හෙදියන්, ඖෂධවේදීන්, රෝහල් සහ ගිලන්රථ සේවාව වෙත අපට සෘජු සම්බන්ධතා තිබේ.
- වෛද්‍යවරයකු සත්කාර නිවාසයට යන තෙක් බලා සිටීම වෙනුවට, ක්ෂණික විශේෂඥ උපදෙස් ලබා ගැනීම සඳහා “ටෙලිහෙල්ත්” - දුරකථන සහ වීඩියෝ ඇමතුම් - භාවිතා කිරීමට අපට හැකිය.
- හදිසි ප්‍රතිකාර ඒකකය වෙත යෑම කරදරකාරී විය හැකි නිසා, වෛද්‍යවරුන් සහ හෙදියන් හැකිතාක් රෝගාතුර වූවන් සඳහා ඔවුන්ගේ කාමරවල ම සත්කාර කරනු ඇත.
- හදිසි ඇමතුම් අංකය ලෙස ඔබේ අංකය ලැයිස්තුගත කර ඇත්නම්, සැලකිලිමත් වීමට හේතුවක් තිබේ නම් අපි ඔබ අමතන්නෙමු.

phn EASTERN MELBOURNE
An Australian Government Initiative

Ambulance Victoria

VVED VICTORIAN VIRTUAL EMERGENCY DEPARTMENT Northern Health

## 2

## ඔබට උපකාර කිරීම සඳහා කළ හැක්කේ මොනවාද?

- නේවාසිකයන්ගේ GP (වෛද්‍යවරයා) සහ අනෙකුත් සම්බන්ධතා යාවත්කාලීන බව සහතික කර ගැනීමට අප අමතන්න. අපට එක්ව වැඩ කරන වේලාවෙන් බැහැර සත්කාර සඳහා සැලැස්මක් සකස් කළ හැකිය.
- ඔබ සෞඛ්‍ය සේවාවක් සඳහා නේවාසිකයෙකු පිටතට ගෙන යන්නේ නම්, කරුණාකර ප්‍රතිකාර සාරාංශයක් ලබා ගෙන ඔබ ආපසු පැමිණෙන විට එය අප සමග බෙදා ගන්න.
- නේවාසිකයාට පූර්ව සත්කාර සැලැස්මක් තිබේ නම්, හෝ ඔවුන් වෙනුවෙන් ක්‍රියා කිරීමට යම් අයෙක් පත් කර ඇති නම්, එම විස්තර අප සතුව ඇති බව සහතික කර ගන්න.



## 3

## ඔබට තවත් කළ හැක්කේ මොනවාද?

- නේවාසිකයාගේ කැමැත්තට ගරු කරන බවට වග බලා ගැනීම සඳහා පූර්ව සත්කාර සැලැස්ම ගැන ඔවුන් සමග කතා කරන්න.
- අවශ්‍ය නම්, ඇටෝර්නි බලය පිහිටුවීම හෝ වෛද්‍ය ප්‍රතිකාර ගැන තීරණ ගන්නෙකු පත් කිරීම ගැන සාකච්ඡා කරන්න.
- ඔබේ නේවාසිකයාට හොඳම සර්වප්‍රකාර සත්කාර සැපයීමට අවශ්‍ය සියලුම තොරතුරු අප සතුව ඇති බව සහතික කර ගැනීමට අප සමඟ කතා කරන්න.
- ඔබට අලුත් විය හැකි ප්‍රතිකාර විකල්ප කිහිපයක් තිබේ. වික්ටෝරියානු අත්‍යා හදිසි අවස්ථා දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවිය (vved.org.au) බැලීම සහ “නේවාසික ස්ථානගත සේවා” සඳහා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවිය (health.vic.gov.au) තුළින් සෙවීම සලකා බලන්න.

